# වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්

## පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ 2016ක් වූ මාර්තු මස 10 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ පිටිගල් කෝරළේ දකුණේ, කම්මල් පත්තුවේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මැද කටුනේරිය අංක 494 සී ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පහළ කටුනේරිය ග්‍රාමයේ පිහිටි මාදන්ගහවත්ත නමැති ඉඩම බෙදා වෙන් කළ බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 2003.04.10 දිනැති අංක 1491 දරන පිඹුරේ දැක්වෙන සහ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 2013.04.19 දිනැති අංක 11375 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 දරන දේපළ සහ එහි පිහිටි සියලු දෙය වේ.

විශාලත්වය : අ. 0, රූ. 0, පර්. 28.60

වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. තිසේරා විසින් සහතික කරන ලද වර්ෂ 2013.07.26 වැනි දිනැති අංක 1369 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම උකස්කරු ලෙස මුතුනාමගොන්නගේ පාතිමා ඇලන් ප්‍රනාන්දු සහ බන්ධනදයින් ලෙස මුතුනාමගොන්නගේ පාතිමා ඇලන් ප්‍රනාන්දු සහ මහගුරුගේ නිර්මලී උදේනි දීප්තිකා ප්‍රනාන්දු විසින් පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2016.01.29 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය* ද, එදින ලක්බිම, ඩේයිලි නිවුස් සහ සුඩර් ඔලි පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - වෙන්නප්පුව වාණිජ මධ්‍යස්ථානයේ සිට මීගමුව හලාවත මාර්ගය ඔස්සේ මීගමුව දෙසට කි. මී. 1ක් පමණ ගොස් වැන්ෂස් ලෝස් පෙරේරා මාවතින් වමට හැරී තුන් මංසන්දිය දක්වා මීටර් 300ක් පමණ ගොස් වමට හැරී මීටර් 100ක් පමණ ගොස් ජයවීදි මාවතේ දකුණට ගොස් මීටර් 100ක් පමණ ගොස් වම් පසට ඇති පුද්ගලික පාරෙහි යන විට වම්පසින් මෙම විෂයගත දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* -වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්),
(2) පලාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක්ද (සියයට දෙක හමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු (රු. 3,000) ද.

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිළේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදල තොරතුරු සඳහා කළමණාකරු - ණය අය කර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 4667218/011 2565573.

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3), විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 011 3068185, 2572940.

02 - 617

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බොරැල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු දෙමහල් නිවසක් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවන් තුළ රාජගිරිය ඔබේසේකරපුර නානායක්කාර මාවත තුළ ගෝතමී ගාඩ්න්ස් හි පිහිටි තුඩුවේකුඹුර නමැති ඉඩමට බලයලත් මානක එස්. ලෝකනාතන් විසින් 1999.12.02 වැනි දින සාදන ලද අංක 4748/1998 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද ලොට් 5 ඒ නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි නානායක්කාර මාවත වරිපනම් අංක 181 ඒ 57 සහ 181ඒ 57/1/1 දේපළ ඇතුලු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 7.75.

*දේපළට පිවිසීම.* - බොරැල්ල සිට දොස්තර එන්. එම්. පෙරේරා මාවත ඔස්සේ රාජගිරිය දෙසට ගෝතමී මාවත දක්වා ගමන් ගෙන වමට හැරී එම මාවතේ හමුවන පාලම පසුකර බෝ ගහ දක්වා පැමිණ දකුණට හැරී ස්වල්ප දුරක් ගමන් ගෙන නැවත වමට හැරී කාසන්ස් කුලී වාහන සේවය (Casons Rent a Car Office) කාර්යාලය දක්වා පැමිණ වමට හැරී ස්වල්ප දුරක් ගමන් ගෙන දකුණට හැරී මීටර් 15ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණු පසින් අදළ දේපළ පිහිටා තිබේ.

මෙම දේපළ වී 2 ප්‍රොපටි මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2016ක් වූ මාර්තු මස 10 වැනි දින පෙ. ව. 11.00 එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.08.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2014.09.05 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ජ්‍යෙෂ්ඨ කළමනාකරු තැන (අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංකය : 011 - 2661835, 011 - 2661836, 011- 2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ,
මහනුවර.

දුරකථන අංකය : 081 - 2210595/ 071- 4755974 / 071 - 8446374.

02- 606

---

**මහජන බැංකුව - පිළියන්දල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**වටිනා ව්‍යාපාරික පුද්ගලික සමාගම**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මඩපාත යන ගම පිහිටි "කහටගහවත්ත" නමැති බලයලත් මානක එස්. වික්‍රමගේ මහතා විසින් 2003.09.20 වැනි දින මැන සාදන ලද අංක 9128 දරන පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් එකයි පර්චස් තිස් එකයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 31.5) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

ඉහත සඳහන් ඉඩම 1948.06.07 වැනි දින මිනින්දෝරු ඩබ්. ඒ. ඇල්. ද සිල්වා මහතා මැන සාදන ලද අංක 1242 දරන පිඹුර ප්‍රකාර (අ. 3 රූ. 3 පර්. 2) විශාල ඉඩමෙන් නොබෙදූ හතෙන් පංගුවක බිම් කොටසට බලයලත් මිනින්දෝරු ඇන්. ද ඇන්. වීරක්කොඩි මහතා විසින් 1994.10.13 දින මැන සාදන ලද අංක 4094 දරන පිඹුර ප්‍රකාරව (අ. 0 රූ. 1 පර්. 35) විශාලව නැවත කළ මැනීමක් වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2016ක් වූ මාර්තු මස 15 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2009.08.21 දිනැති *රජයේ ගැසට් පත්‍රය* 2009.11.18 දිනැති දිනමිණ සහ ඩේලිනිව්ස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීම්වලට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - පිළියන්දල නගරයෙන් හොරණ පාරේ පුවක්ගස් හන්දියෙන් දකුණට ඇති මඩපාත පාරේ කි. මී. 3ක් පමණ ගිය විට හමුවන බටකැත්තර හන්දියෙන් දකුණට දාම්පේ පාරේ මී. 500ක් පමණ යාමේ දී, වම්පසට සෙන්මිචෙල් නිවාඩු නිකේතනය දෙසට යන දාම්පේ පාර හමුවේ. මෙම පාරේ කි. මී. 01ක් පමණ යාමේ දී වම්පසට හමුවන ගංගාරාම විහාර පාරේ මී. 50ක් පමණ ඉදිරියට යන විට එම පාරට මායිම්ව වම්පස අංක 92 දරන ස්ථානයේ මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදක ගාස්තු වශයෙන් රු. 1,000ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත හයිලෙවල් පාර, නුගේගොඩ, අක 177 A හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ පිටත) ගෙවිය යුතු ය.

දුරකථන අංක : 825102, 825101, 817737.

ඉහත සඳහන් ඉතිරි මුදල දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ එම දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු), වෙන්දේසිකරු හා
තක්සේරුකරු, උසාවි කොමසාරිස්
හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145, 0718021206

02-613/1

**මහජන බැංකුව - අවිස්සාවේල්ල ශාඛාව (029)**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

සීමාසහිත සබරගමුව තේ (පුද්ගලික) සමාගමට අයිති වටිනා දේපළ සහ යන්ත්‍ර උපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

සබරගමුව පළාතේ, කැගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයිති බටහිර අලුගම් කෝරළයේ මාගම්මන ග්‍රාමයෙහි හා මැනුම්පති විසින් සාදවා තමා භාරයේ තබා ඇති කැ. 3725 කැ. 3727 වැනි ක්ෂේත්‍ර පොතෙහි කැ. 3049 වැනි පිඹුරේ 63 වැනි බිම් කට්ටිය වශයෙන් දක්වා ඇති උතුරට : පාර සහ කැබලි අංක 62 ද, නැගෙනහිරට : පාර සහ කැබලි අංක 66 ද, දකුණට : මු. පිඹුරෙහි කැබලි අංක 14, 13 සහ මහා මාර්ගය ද, බස්නාහිරට මහා මාර්ගය සහ පාර ද, යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි දෙකයි හයයි බිංදුවක් (හෙ. 0.2260) (පර්චස් 89.35) විශාල වැරැල්ලවත්ත නමැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඩම් කැබැල්ල වේ.

යන්ත්‍ර සූත්‍ර. - (1) Electronic Weighing Scale
(2) Manual Weighing Scale
(3) Indian Trough Jan Units
(4) Belt Conveyer
(5) Vibratory Conveyer
(6) Conveyer Control System
(7) Including Rollers and Roll Breakers
(8) Michi Shifter

මෙම උකස්කරයක් අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක දෙහි ප්‍රා. ලේ. 579 යටතේ සහ වංචල 24/411 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2016 මාර්තු මස 10 වැනි දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2014.11.07 දිනැති *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2015.04.08 දිනැති දිනමිණ සහ ඩේලිනිව්ස් පුවත්පත්වල පළ වූ වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - නුගේගොඩ සිට අවිස්සාවේල්ලට ගොස් හැටන් පාරේ කි. මී. 12ක් පමණ මාගම්මන දක්වා ගොස් දකුණු පසට ඇති පනාවත්ත පාරේ මීටර් 100ක් පමණ යන විට මෙම දේපල හමුවේ. ප්‍රවේශයට බාධක නොමැත. වාහනයකින් දේපළට ප්‍රවේශ විය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරුගේ හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත හයිලෙවල් පාර, නුගේගොඩ, අක 177 ඒ හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ පිටත) ගෙවිය යුතු ය.

දුරකථන අංක : 4305863, 2812260, 2825101 ෆැක්ස් අංකය : 813969

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ එම දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු), වෙන්දේසිකරු හා
තක්සේරුකරු, උසාවි කොමසාරිස්
හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145, 0718021206

02-613/2

---

**ලංකා බැංකුව - හොරණ අධිශ්‍රේණි ශාඛාව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 73843655

කුකුළගේ ජනක පුෂ්පකුමාර නමින් ද ප්‍රසිද්ධ කුකුළගේ දොන් ජනක පුෂ්පකුමාර මහතාට (කහටපිටිය සමන්ත එන්ටර්ප්‍රයිසස් හි තනි අයිතිකරු) අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.08.21 දිනැති අංක 1929 දරන *ගැසට් පත්‍රයේ* හා 2015 අගෝස්තු මස 22 වැනි සෙනසුරාදා දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2016.03.09 වැනි සිව පෙ. ව. 11.30 ට කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**පළමු උපලේඛනය**

එකී උඩුව ග්‍රාමයේ පිහිටි අම්පිටිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කන්නංගර විසින් සාදන ලද 1996 අප්‍රේල් මස 02 දිනැති 296B /1996 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමා නිර්ණය

කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3 උතුරට : ප්‍රධාන පාරද, නැගෙනහිරට : ලෙට් 8 සහ 9 හි 3/4 පංගු ද, දකුණට : ඩබ්. ඩී. ඒබිස් සිඤ්ඤෝ සහ වෙනත් අයට අයිති දේපළ ද, බස්නාහිරට : ලොට් 6 හා 7 හි 1/4 කොටස ද, මායිම්ව එකී අංක 296 බී 1996 දරන පිඹුරට අනුව රූඩ් තුනයි පර්චස් තිස්හතක (අ. 0 රූ. 3 පර්. 37) ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි සහ ගහකොළ ද සමග වේ. මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 195/36 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඩී. ජයලත් මයා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
හොරණ අධිශ්‍රේණි ශාඛාව.

02-600

---

## ලංකා බැංකුව - හොරණ අධිශ්‍රේණි ශාඛාව

1986 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම.

ණය යොමු අංකය : 9534033.

කුකුළගේ ජනක පුෂ්පකුමාර නමින් ද ප්‍රසිද්ධ කුකුළගේ දොන් ජනක පුෂ්පකුමාර මහතාට (කහටපිටිය සමන්ත එන්ටර්ප්‍රයිසස් හි තනි අයිතිකරු) අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.07.24 දිනැති අංක 1925 දරන ගැසට් පත්‍රයේ හා 2015 ජූලි 10 වැනි සිකුරාදා දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2016.03.09 වැනි දින පෙ. ව. 11.00 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරණ ප්‍රාදේශීය සභා (කනන්විල උප කාර්යාලය) සීමාවේ රයිගම් කෝරළේ කුඹුකෙ පත්තුවේ, අංක 614 සී දරන කුඩා උඩුව ග්‍රාමයේ පිහිටි අම්පිටිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කන්නංගර විසින් සාදන ලද 1996 අප්‍රේල් 02 දිනැති අංක 296ඒ/1996 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : පාර සහ ලොට් 10 සහ 11 ද, දකුණට : ඩබ්. ඩී. ඒබිස් සිඤ්ඤෝ ඩබ්. ඩී. රුවානිස් සිඤ්ඤෝ සහ වෙනත් අයට අයිති දේපළ ද, බස්නාහිරට : ලොට් 8 සහ 9 හි 1/4 කොටස ද, මායිම් ව එකී අංක 296ඒ/1996 දරන පිඹුරට අනුව අක්කර එකයි රූඩ් දෙකක (අ. 01 රූ. 2 පර්. 0) බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 195/37 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඩී. ජයලත්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
හොරණ අධිශ්‍රේණි ශාඛාව.

02-599

---

## ලංකා බැංකුව - හොරණ අධි ශ්‍රේණි ශාඛාව

1986 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම.

ණය යොමු අංකය : 73843655.

කුකුළගේ ජනක පුෂ්පකුමාර නමින් ද ප්‍රසිද්ධ කුකුළගේ දොන් ජනක පුෂ්පකුමාර මහතාට (කහටපිටිය සමන්ත එන්ටර්ප්‍රයිසස් හි තනි අයිතිකරු) අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.08.21 දිනැති අංක 1929 දරන ගැසට් පත්‍රයේ හා 2015 අගෝස්තු 22 වැනි සෙනසුරාද දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2016.03.09 වැනි දින පෙ. ව. 10.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හොරණ ප්‍රාදේශීය සභා (කනන්විල උප කාර්යාලය) සීමාවේ රයිගම් කෝරළේ, කුඹුකෙ පත්තුවේ, අංක 614 සී දරන කුඩා උඩුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩුව ග්‍රාමයේ පිහිටි ''අම්පිටිය'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කන්නංගර විසින් සාදන ලද 1996 අප්‍රේල් 02 දිනැති අංක 296/1996 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : ලොට් 10 සහ 11 හි 1/4 ක කොටස ද, දකුණට ඩබ්. ඩී. ඒබ්ස් සිඤ්ඤෝට අයත් දේපළ ද, බස්නාහිරට: ලොට් 2 සහ 5 ද, මායිම්ව එකී අංක 296A/1996 දරන පිඹුරට අනුව අක්කර එකයි රූඩ් එකයි (අ. 01, රූ. 1, පර්. 37) බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 195/35 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඩී. ජයලත් මයා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
හොරණ අධිශ්‍රේණි ශාඛාව.

02-598

---

### මහජන බැංකුව - ජා-ඇල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ජා-ඇල ප්‍රාදේශීය සභා බල සීමාවේ ඒකල, කුරුඳුවත්ත ගමේ ජොසිටාවත්ත නමැති ඉඩමෙහි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි වටිනා නිවසක් සහිත පර්චස් දහයක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 10) විශාල බිම් කොටස මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2016.03.08 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2009.07.17 වැනි දින ද, ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2009.09.25 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - ජා-ඇල නගර මධ්‍යයෙන් වැටී ඇති ජා-ඇල ගම්පහ මාර්ගයේ මීටර් 500ක් පමණ ගමන් කළ විට රජ මාවත හමුවේ. රජ මාවතේ මීටර් 750 ක් පමණ යන විට වම්පසින් හමුවන බුදුපිළිමය අසලින් ඇති ගුරු පාරේ මීටර් 150ක් පමණ ගිය විට දකුණු පසින් මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කළමනාකරු, මහජන බැංකුව, ජාඇල ශාඛාව වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත්, දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.

*දුරකථන අංකය* : 033 - 2222325, 033 - 2225008, 033 - 2231901
*ෆැක්ස් අංකය* : 033 - 2226165, 033 - 2226741.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්.
වසර 124 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

02-530

**ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී**
(කලින් ඩීඑෆ්සීසී බැංකුව)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පණතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1150 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළේ, මැද පත්තුවේ, ගනේගොඩ ග්‍රාමයේ පිහිටි ඇටගල්ලේහේනේවත්ත හෙවත් ඇටගල්ලේහේන ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු කේ. නන්දසේන විසින් සාදන ලද 2006 මාර්තු මස 06 වැනි (වඩා නිවැරදිව 2006 මාර්තු 20 වන) දිනැති අංක 2455 දරන පිඹුරේ දැක්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක් 0, රූඩ් 0, පර්. 28 එහි පිහිටි සියල්ල සහිතව රත්නපුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත. රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. රණසිංහ විසින් සහිතක කරන ලද, 2011 දෙසැම්බර් මස 22 වැනි දිනැති අංක 1150 දරන උකස්කරය ප්‍රකාර රත්නපුර රිහානා ට්‍රේඩ් සෙන්ටර් නම් ව්‍යාපාරය පවත්වාගෙන යන මොහොමඩ් අමීන් මොහොමඩ් සාපි විසින් ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සීට (කලින් ඩීඑෆ්සීසී බැංකුව)ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2016 මාර්තු මස 09 වැනි දින (බදාදා) පෙ.ව. 11.00ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරයට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 1,01,000.00ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා ඝෝෂකගේ ගාස්තුව රු. 500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුර රු. 2,000.

ගැනුම් මිළෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සීහි නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2371371.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 124ක සේවා විශිෂ්ටත්වය සමගින්

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk
*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

02 - 529

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (තලවතුගොඩ ශාඛාව)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංක පීකිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, 522D පිටකෝට්ටේ ග්‍රාම නිලධාරි වසමේ කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාව තුළ පිටකෝට්ටේ හි පිහිටි පිටකෝට්ටේ සුහසාධක මාවතේ, වරිපනම් අංක 38/7 දරන අඹගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ටී. අබේසිංහ විසින් 2009 නොවැම්බර් මස 01 වැනි දින සාදන ලද අංක 1701 දරන පිඹුරේ ලොට් 1 දරන ප්‍රමාණය පර්චස් විසිතුනයි දශම පහ (අක් 0, රූඩ් 0, පර්. 23.5) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

පහත සඳහන් විස්තර මාර්ග වෙන්කිරීම මතුපිටින් මගදිගේ හා ඒ තුළ ගමන් කිරීමේ ඇති අයිතිය ද සමග වේ.

ඉහත සඳහන් පිටකෝට්ටේ පිහිටි අඹගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් 1986 අප්‍රේල් මස 08 වැනි දින සාදන ලද අංක 3715 දරන පිඹුරේ සඳහන් ලොට් 1E (අඩි 10ක් පළල පාරක් සඳහා වෙන්කරන ලද) ප්‍රමාණය පර්චස් තුනයි දශම හතයි බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 3.70) විජේසිංහගේ නිරෝෂන් ක්‍රිෂාන්ත ෆොන්සේකා සහ බර්නඩෙත් නිලන්ති ඩයස් කරුණාරත්න ණයකරුවන් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සීට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2016ක්වූ මාර්තු මස 11 වැනි දින පෙ.ව. 10.30ට ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2015.11.27 වැනි දින රජයේ *ගැසට් පත්‍රය*ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2016.02.19 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2016.02.23 දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම* .- බොරැල්ල නගර මධ්‍යයේ සිට කොටා පාර ඔස්සේ ශ්‍රී ජයවර්ධනපුර මාවතට පැමිණ කි.මී. 3.75ක් පමණ දුර ප්‍රමාණයක් ගමන්කර (බත්තරමුල්ල නගර මධ්‍යයට කිලෝමීටරයකට පමණ පෙර) දකුණට හැරී කෝට්ටේ පාරේ මීටර් 100ක් පමණ දුරක් ගමන් කලවිට ඇතුල් කෝට්ටේ හංදිය හමුවේ. නැවත E. W. පෙරේරා මාවතේ (තව ද කෝට්ටේ පාර ලෙස හඳුන්වන) කි.මී. 1.5ක් පමණ දුරක් ගමන් කර (පිටකෝට්ටේ හංදියට කි.මී. 3/4 පමණ පෙර) වමට හැරී බැද්දගාන පාරේ මීටර් 200ක් පමණ දුරක් ගමන්කර නැවත දකුණට හැරී (ෆුට් බෝල් සංගමයට විරුද්ධ පැත්තේ) අඩි 10-12 පළල සුහසාධක මාවතේ මීටර් 150ක් පමණ දුර ප්‍රමාණයක් ගමන්කර අවසාන වශයෙන් වමට ඇති අඩි 10ක් පළල කොන්ක්‍රීට් අතුරා ඇති ගමන් මාර්ගයේ මීටර් 25ක් පමණ ගියවිට අදාළ දේපළ දකුණු අත පැත්තේ පිහිටා ඇත. අදාළ දේපළ හඳුනා ගැනීම සඳහා අංක 38/7 සුහසාධක මාවත, බැද්දගාන, පිටකෝට්ටේ.

*ගෙවීමේ ක්‍රමය* .- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිරු වෙත මුදලින් ගෙවිය යුතුය :

01. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500.00,
06. වෙන්දේසිය සඳහා වැයකරන ලද සියලුම ප්‍රචාරක වියදම්
07. ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි.
08. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ තලවතුගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෝෂ්ට වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහළ, උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011-2445393
ඊමේල් senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 07, සුරම්‍ය ගොඩනැගිල්ල,
කෝට්ටේ පාර, තලවතුගොඩ,
දුරකථන අංක : 011-2773551/011-2773452
ෆැක්ස් අංකය : 011-2773553.

02 - 603

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.